සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I

නම / විභාග අංකය :-............................................................ කාලය: පැය 02 යි

- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ධර්මය තම ගුරුවරයා ලෙස තබාගැනීමට බුදුන් වහන්සේ තීරණය කළේ බුදු වීමෙන්,

(1) පළමු සතියේ දී ය. (2) තෙවන සතියේ දී ය.
(3) පස්වන සතියේ දී ය. (4) සත්වන සතියේ දී ය.

(2) බුදු සසුනේ බුදුන් හා දහම් සරණ ගිය ප්‍රථම උපාසකවරු වන්නේ,

(1) උපතිස්ස කෝලිත පිරිවැජියන් ය. (2) තපස්සු භල්ලුක සහෝදරයන් ය
(3) චූලෝදර මහෝදර නාරජුන් ය. (4) තුන් බෑ ජටිලයන් ය.

(3) පස්වග තවුසන් රහත් භාවයට පත් වූ සූත්‍රය වන්නේ,

(1) අනත්ත ලක්ඛන සූත්‍රය. (2) දම්සක් පැවතුම් සූත්‍රය.
(3) ආදිත්ත පරියාය සූත්‍රය. (4) දේවදූත සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ අපේ රටේ මහියංගනයට වැඩම කළේ,

(1) වෙසක් පෝය දා ය. (2) බක් මස අමාවක පෝය දා ය.
(3) දුරුතු පෝය දා ය. (4) පොසොන් පෝය දා ය.

(5) බුදු සසුනේ ප්‍රථම වරට පූජා කළ ආරාමය,

(1) නිග්‍රෝධාරාමය. (2) වේළුවනාරාමය.
(3) ජේතවනාරාමය. (4) වාලුකාරාමය

(6) බුදුරජාණන් වහන්සේ පිළිබඳව විශාල ගෞරවයක් පැහැදීමක් සිත් තුළ උපදවා ගැනීමට උපකාර වන භාවනාව වනුයේ,

(1) ධම්මානුස්සති භාවනාව (2) සීලානුස්සති භාවනාව
(3) බුද්ධානුස්සති භාවනාව (4) සංඝානුස්සති භාවනාව

(7) ත්‍රිවිධ චෛත්‍යය පිළිවෙලින් වන්දනා කිරීම සැදැහැවත් බෞද්ධයකු ගේ ලක්ෂණයකි. මෙහි ත්‍රිවිධ චෛත්‍යයට අයත් වන කරුණ වන්නේ,

(1) පිළිම වහන්සේය (2) මහා පිරුවානා පොත් වහන්සේ ය.
(3) පන්සිය පනස් ජාතක පොත් වහන්සේය (4) දළදා වහන්සේ ය.

(8) සියලු සත්ත්වයන්ට කරුණාව මෛත්‍රිය වැඩිය යුතු ආකාරය දැක්වෙන සූත්‍රය,

(1) පරාභව සූත්‍රය (2) මහා මංගල සූත්‍රය
(3) කරණීය මෙත්ත සූත්‍රය (4) වසල සූත්‍රය

(9) අනේපිඬු සිටුතුමා කහවනු පනස් හතර කෝටියක් වියදම් කර ගොඩනැගූ විහාරය වන්නේ,

(1) ජේතවනාරාමය (2) පූර්වාරාමය
(3) වේළුවනාරාමය (4) වාලුකාරාමය

(10) ගාථා 423 වග්ග 26 ක් ඇතුළත් බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන ධම්මපදය නම් ග්‍රන්ථය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,

(1) ඛුද්දක නිකායට ය. (2) සංයුක්ත නිකාය ට ය.
(3) අංගුත්තර නිකායට ය. (4) දීඝ නිකායට ය.

(11) සිරිත් විරිත් පිළිබඳ තොරතුරු ඇතුළත් "සිරිත් මල් දම" පොතෙහි කතුවරයා වන්නේ,

(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය. (2) එස් මහින්ද හිමි ය.
(3) වීදාගම මහා මෛත්‍රී හිමි ය. (4) ඇල් ඇම් සිල්වා ගුරු මුහන් දිරම් තුමා ය.

(12) ගිහි බෞද්ධයාගේ නිත්‍ය සීලය වන්නේ,

(1) පංච සීලයයි. (2) උපසම්පදා සීලයයි.
(3) ආජීව අෂ්ටමක සීලයයි. (4) දස සීලයයි.

(13) නිර්වාණගාමී මගට පිවිසීමේදී අත්‍යවශ්‍ය වන ධර්ම සමූහය බුද්ධකාරක ධර්ම ලෙස හඳුන්වයි. එම ධර්ම කරුණු,

(1) දස පාරමිතා ලෙස හඳුන්වයි. (2) දස පුණ්‍ය ක්‍රියා ලෙස හඳුන්වයි.
(3) දස රාජධර්ම ලෙස හඳුන්වයි. (4) දස කුසල් ලෙස හඳුන්වයි.

(14) හිවලා සහ පවුලේ සැමට තම වාසස්ථානය අසලම නවාතැන් දුන් සිංහයකු ගැන කියවෙන ජාතක කතාව වන්නේ,

(1) වට්ටක ජාතකය (2) සේරිවාණිජ ජාතකය
(3) තිත්තිර ජාතකය (4) ගුණ ජාතකය

(15) බුද්ධ කාලීන භාරතයේ විසූ ඇතැම් ශාස්තෘවරුන් දේශනාකර ඇත්තේ "සියල්ල සිදුවන්නේ සර්වබලධාරී දෙවියකුගේ මැවීම අනුව බවයි" මේ අදහස,

(1) ඊශ්වර නිර්මාණවාදය නම් වේ. (2) අමරාවික්ඛේපවාදය නම් වේ.
(3) අකිරියවාදය නම් වේ. (4) උච්ඡේදවාදය නම් වේ.

(16) ගිරිමානන්ද සූත්‍රය අනුව රෝග හට ගන්නා ක්‍රමයක් වන "සන්නිපාතිකා ආබාධා" යනු,

(1) පිත කිපීමෙන් හටගන්නා ආබාධයන් ය. (2) ඍතුවිපර්යාස නිසා හටගන්නා ආබාධයන් ය.
(3) අනුන්ගෙන් බෝ වීම නිසා හටගන්නා ආබාධයන් ය (4) කර්ම විපාක නිසා හටගන්නා ආබාධයන් ය.

(17) බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය පිළිබඳ ප්‍රථමයෙන්ම කරුණු ගෙනහැර දැක් වූ සූත්‍රය වන්නේ,

(1) දම්සක් පැවතුම් සූත්‍රය (2) රතන සූත්‍රය
(3) අනත්ත ලක්ඛන සූත්‍රය (4) කුල සූත්‍රය

(18) කායානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා හා ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨාන භාවනාව වැඩීම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අයත් වන මාර්ග අංගය වන්නේ,

(1) සම්මා දිට්ඨි (2) සම්මා සමාධි
(3) සම්මා සති (4) සම්මා සංකප්ප.

(19) මාතලේ අලුවිහාරයේ දී පැවැත්වූයේ,

(1) පළමු ධර්ම සංගායනාවයි (2) සිව්වන ධර්ම සංගායනාවයි.
(3) දෙවන ධර්ම සංගායනාවයි (4) තුන්වන ධර්ම සංගායනාවයි

(20) කුඹුරුවලින් අස්වනු ලබා ගැනීමෙන් අනතුරුව එහි පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම.

(1) අග්‍රශස්‍ය දානය යි. (2) මී පිඬු දානයයි.
(3) සාංඝික දානයයි. (4) සලාක දානය යි.

(ලකුණු 02 x 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය II

නම / විභාග අංකය :-.............................................................

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.
- 02 සිට 06 දක්වා ප්‍රශ්න වල I කොටසට ලකුණු 02 ක්ද II කොටසට ලකුණු 03 ක් ද III කොටසට ලකුණු 05 ක් ද හිමිවේ.

1.

i. පස්වග තවුසන් නම් කරන්න.

ii. මිගාර මාතා නමින් ප්‍රකට වූ උපාසිකාව නම් කරන්න.

iii. ඉතිපිසෝ පාඨයේ සඳහන් බුදුගුණ දෙකක් නම් කරන්න.

iv. ගෞතම බුදු සසුනේ අග්‍ර දායකයා සහ අග්‍ර දායිකාව නම් කරන්න.

v. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකම් දෙකක් නම් කරන්න.

2.

i. පන්සිල් වල පළමු සිල් පදය පාලියෙන් ලියන්න.

ii. පංචශීලයේ නොමැති ආජීව අෂ්ටමක සීලයේ ඇති සිල් පද තුනක් ලියන්න.

iii. සිල් රැකීමෙන් ඔබේ ශිෂ්‍ය ජීවිතයට සිදුවන යහපත ගැන වාක්‍ය පහක් ලියන්න.

3.

i. අඥාන වෙළෙඳ නායකයකුගේ හා ඥානවන්ත වෙළෙඳ නායකයකුගේ ක්‍රියා කලාපය පිළිබඳව විස්තර කෙරෙන ජාතක කතාව නම් කරන්න.

ii. එම ජාතක කතාවෙන් අපට ගත හැකි යහපත් ආදර්ශ තුනක් නම් කරන්න.

iii. නායකත්ව ගුණාංග ශිෂ්‍ය ජීවිතයට සම්බන්ධ කර ගැනීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න.

4.

i. බුදු දහමෙහි දැක්වෙන නියාම ධර්ම වලින් දෙකක් නම් කරන්න.

ii. චතුරාර්ය සත්‍යය අතරින් සත්‍ය තුනක් නම් කරන්න.

iii. දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

5.

i. සබ්බේ තසන්ති දණ්ඩස්ස

සබ්බේසං ජීවිතං පියං යන ධම්මපදය ගාථා වේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ii. භික්ෂූන් වහන්සේ සිව්පසය පරිභෝග කළ යුත්තේ පාපයෙන් වැළකී, කුසල් දම්හි සිත එකග කරගෙන, බ්‍රහ්ම චරියාවෙහි නිරත වීම පිණිසය. මෙහි සඳහන් වන සිව්පසයෙන් 03 ක් නම් කරන්න.

iii. හොඳ නරක තෝරා බේරා ගැනීමට සහ යහපත් දේ කිරීමට ඔබට උපකාරී වන ධර්ම කරුණු පිළිබඳ කෙටියෙන් විස්තර ලියන්න.

6.

i. සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කළ පොහොය දිනය නම් කරන්න.

ii. වෙහෙර වහන්සේ (දාගැබ) මුල්කරගෙන නිර්මාණය කරන ලද කලා අංග 03 ක් නම් කරන්න.

iii. මහින්දාගමනයෙන් අප ලත් දායාද විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න. එක් කොටසකට ලකුණු 05 ක් හිමිවේ.

i. සත්සතිය.

ii. අනේපිඬු සිටුතුමා.

iii. බුදුරජාණන් වහන්සේ අසරණයෙකුට පිහිට වූ ආකාරය.

iv. ආජීව අෂ්ටමක සීලය.

Remove Watermark Now

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 07 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

1 - 3
2 - 2
3 - 1
4 - 3
5 - 2
6 - 3
7 - 1
8 - 3
9 - 1
10 - 1

11 - 4
12 - 1
13 - 1
14 - 4
15 - 1
16 - 3
17 - 1
18 - 3
19 - 2
20 - 1

pdfelement

1)

i. කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දිය ,මහානාම අස්සජි
ii. විශාකා මහ උපාසිකාව
iii. අරහං, සම්මා සම්බුද්ධ,විජ්ජාචරණ සම්පන්න ආදී වශයෙන් බුදු ගුණ නවයෙන් ඕනම දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.
iv. අග්‍රදායකයා, අනේපිඩු සිටුතුමා, අග්‍ර දායිකාව විශාකා මහ උපාසිකාව
v.
- ගුරුතුමා දුටුවිට හුනස්නෙන් නැගිටීම.
- ගුරුවරුන්ට උපස්ථාන කිරීම.
- ලබා දෙන උපදෙස් වලට හොඳින් සවන් දී පිළිපැදීම.
- ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටුකර දිම.
- හොඳින් ඉගෙන ගැනීම.

2)

i. පානාති පාතා වේරමණී ශික්ඛාපදං සමාදියාමි.
ii.
- පිසුණා වාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
- ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
- සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි
- මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි

Remove Watermark Now

iii. ශිෂ්‍ය ජීවිතයට සීලය වැදගත් වන ආකාරය දැක්වෙන වාක්‍ය 05 ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

3)

i. අපණ්ණක ජාතකය

ii.

- දූරදක්නා නුවණින් ක්‍රියා කිරීම, උපාය ශීලී බව
- වගකීමෙන් යුතුව කටයුතු කිරීම යනාදී සිදුවෙයි 83 පිටුවෙහි සඳහන් නායකත්ව ගුණාංග වලින් ඕනෑම තුනක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. නායකයෙකු සතු ගුණාංග තම ශිෂ්‍ය ජීවිතයට සම්බන්ධ කරගනිමින් දියුණුව සැලසෙන ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. එහිදි කැපවීමෙන් අධ්‍යාපන කටයතු කිරීම, නිවැරදි ක්‍රියා පමණක් කිරීම, එඩිතර බවින් බුද්ධිමත්ව කටයුතු කිරිම, සුහද ශීලී බව, සැලසුම් සහගත බව ආදී කරුණු ඇතුළත් විය යුතුයි.

4)

i. උතු නියාම, බීජ නියාම, ධම්ම නියාම, කම්ම නියාම, චිත්ත නියාම

ii. දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය

iii. සසර උපන් සත්ත්වයාට මුහුණ දීමට සිදුවන ජාති,ජරා,ව්‍යාධි,මරණ පිළිබඳව ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (117 පිටුව)

5)

i. අත්තානං උපමං කත්වා
න හනෙය්‍ය න ඝාතයෙ

ii. චීවර, පිණ්ඩපාත, ගිලානප්‍රත්‍ය, සේනාසන,

iii. අත්තුපනායික ධර්ම පර්යාය විස්තර වන පිළිතුරට ලකුණු ලබා දෙන්න.

6)

i.

- උඳුවප් මස පුර පසළොස්වක පොහොය දා ය.

ii. වාහල්කඩ, වටදාගෙය, මුරගල ,කොරවක්ගල, පියගැටපෙළ

iii.

- විධිමත්ව සැකසුණු ආගමක් ලැබීම.
- ඇදහිලි හා විශ්වාස වෙනුවට විධිමත් වන්දනා මාන ක්‍රමයක් බිහිවීම.
- බෞද්ධ සාහිත්‍යයක් බිහිවීම.
- රජතුමා බෞද්ධයෙකු වීම.
- ගෘහ නිර්මාණ ශිල්පය, කලා ශිල්ප බිහි වීම.
- කෘෂිකාර්මික ජීවන රටාවක් බිහි වීම.

7)

i. සත්සතිය -
සත්සතිය නම් කර තිබිය යුතුය.

ii. අනේපිඩුසිටු තුමා එතුමාගේ මුල් නම, ජේතවනාරාමය ගොඩනැගුණ ආකාරය, දන් දුන් ආකාරය, විස්තර කර තිබිය යුතුය.

Remove Watermark Now

iii. බුදු රජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වීම යටතේ අසරණ මහළු පියෙක්, වරදට හසු වූ නිවැරදි ගොවියෙක්, සෝපාක, වියෝ දුකින් උමතු වූ පටාචාරා, ගිලනුන්ට උපස්ථාන කිරීම ආදී තොරතුරු හෝ එක් කතාවක් ඇතුළත් පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

iv. ආජීව අෂ්ටමක සීලය නම් කර තේරුම

v. දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

pdfelement